60472

**OL/2009/40-S-I,II**

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
*All Rights Reserved]*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**40 S I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2009 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2009 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2009

| | | |
|---|---|---|
| සංගීතය (සිංහල) | I,II | පැය තුනයි |
| சங்கீதம் (சிங்களம்) | I,II | மூன்று மணித்தியாலம் |
| Music (Sinhala) | I,II | Three hours |

## සංගීතය (සිංහල) I

සැලකිය යුතුයි :
- (i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- (ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- (iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- (iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.
- (v) පිළිතුරු සැපයීමෙන් පසු I හා II පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

1. සරිගරිසරිස-, රිගමගරිගරි-, ………………, මෙම ස්වර අභ්‍යාසයේ හිස්තැනට සුදුසු ස්වර කාණ්ඩය තෝරන්න.
(1) ගපමගපමග- (2) ගපමපගමග- (3) ගමපමගමග- (4) ගරිමගපමග-

2. ස්වර ස්ථාපන ගීතවල මුල් පාදයේ ස්වර රටා ඊළඟ පාදවලද පිහිටයි. 'ස - රි ස / රි - ග රි / ග - ම ග / ප - ප - /' යනුවෙන් ආරම්භ වන ස්වර ස්ථාපන ගීතයක ඊළඟ ස්වර පාදයට වඩාත් සුදුසුවන්නේ,
(1) රි - ග රි / ග - ම ග / ම ප ධ ප / නි ධ ප - /
(2) ග - ම ග / ම - ප ම / ප - ධ ප / ස් නි ධ ප /
(3) ම - ප ම / ප - ධ ප / ධ - නි ධ / ස් - ස් - /
(4) රි - ග ම / ප - ධ ප / ධ නි ස් රි් / ස් ස් - -/

3. "මන බන්ධන හඩ නංවන රස වැහෙන ගී වින්දන" මෙම ගී පදය උච්චාරණයේ දී මතුවන රිද්ම රටාව වන්නේ,
(1) X X / X X X / X X / X X X / (2) X X / X - X X / X X / X - X X /
(3) X - / X - - / X - / X - - / (4) X X X / X X X X / X X X / X X X X /

4. "සුවඳ පද්ම ඕලු ආදි නොයෙක පුෂ්පයෙන් සැදී" මෙම ගී පාදයට වැයීම සඳහා වඩාත් සුදුසු තාලය වන්නේ,
(1) ධගි / නක / නක / ධින / (2) ධධිං / ධධධිං / තතිං / ධධධිං
(3) ධින / ධිධින / තින / ධිධින / (4) ධධින / ධතුන /

5. "සඳවා සුදුවැලි පිවිතුරු" මෙම කවි පාදයේ ඇත්තේ,
(1) ලඝු අකුරු පමණි. (2) ගුරු අකුරු පමණි.
(3) ලඝු සහ ප්ලුත අකුරු මිශ්‍රව ය. (4) ලඝු සහ ගුරු අකුරු මිශ්‍රව ය.

- පහත සඳහන් වගුවේ නිර්දේශිත රාගවලට අයත් සර්ගම්වල ස්ථායි කොටස්හි ස්වර ඇතුළත් වේ. එහෙත් එම ස්වර පාද අයත් රාගවලට නියමිත ස්වර සංඥා යොද නැත. එම වගුව ආශ්‍රයෙන් අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| A | ග ප ධ නි / ස - ධ ප / ම ග ම රි / ස රි ස - / |
| B | නි ධ ම / ප ග රි / ස රි ග / ම ප - / |
| C | ස ස ධ ප / ග රි ස රි / ග - ප ග / ධ ප ග - |
| D | නි ස / ම ග රි / ස - / ප නි ස / |
| E | නි ධ - ප / ම ප ග ම / ප - - - / ප ම ග රි / |

6. සියලු ම ස්වර ශුද්ධ වූ රාගයට අයත් සර්ගම් පාදය ඇතුළත් තීරුව වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

[ දෙවැනි පිටුව බලන්න.

7. B තිරුවට අයත් ස්වර පාදයේ,

(1) කෝමළ ග,නි, ලකුණු කළවිට එය හිම්පලාසී රාගයට අයත් ය.
(2) කෝමළ ග,නි, ලකුණු කළවිට එය කාෆි රාගයට අයත් ය.
(3) ශුද්ධ ස්වර ලෙස ම තැබූවිට එය භූපාලි රාගයට අයත් ය.
(4) තීව්‍ර මධ්‍යමය ලකුණු කළවිට එය යමන් රාගයට අයත් ය.

8. C තිරුවට අයත් ස්වර පාදය අයත් රාගයේ,

(1) ආරෝහණ සහ අවරෝහණයේ ස්වර හත ම යෙදේ.
(2) ආරෝහණයේ ස්වර පහකි. අවරෝහණයේ ස්වර හතකි.
(3) ආරෝහණයේ ස්වර හයකි. අවරෝහණයේ ස්වර හතකි.
(4) ආරෝහණ සහ අවරෝහණයේ ස්වර පහ බැගින් යෙදේ.

9. D තිරුවට අයත් ස්වර පාදය අයත් සරගම් ගීතයේ අන්තරා ආරම්භ වන්නේ,


(1) පපධනි ස-ස- ධනිසරි සනිධප යනුවෙනි. (2) ගගපධ පස-ස ධධසරි ගරිසධ යනුවෙනි.
(3) ගගපධ පස-ස නිරිගරි සනිධප යනුවෙනි. (4) මප මගුම පනි පනිස යනුවෙනි.

10. E තිරුවට අයත් ස්වර පාදය අයත් රාගයේ,

(1) ධ,ග ස්වර වාදි සංවාදි වේ. (2) ග,නි ස්වර වාදි සංවාදි වේ.
(3) ප,ස ස්වර වාදි සංවාදි වේ. (4) රි,ප ස්වර වාදි සංවාදි වේ.

● පහත වගුවේ දක්වෙන රූප සටහන් රංග සම්ප්‍රදායන් හා සම්බන්ධ අවනද්ධ වාද්‍ය භාණ්ඩ වේ. එම රූපසටහන් අධ්‍යයනය කර අංක **11** සිට **21** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| A | B | C | D |
|---|---|---|---|




11. A,B,C සහ D යන අවනද්ධ භාණ්ඩ පිළිවෙළින් නම් කරනුයේ කෙසේ ද?

(1) ගැටබෙරය, දික්බෙරය, තබ්ලාව, ඩෝලක් (2) මද්දලය, දික්බෙරය, තබ්ලාව, ඩෝලක්
(3) ඩෝලක්, දික්බෙරය, තබ්ලාව, මද්දලය (4) තබ්ලාව, දික්බෙරය, මද්දලය, ඩෝලක්

12. "දිං තං තං ගතිත ගතං" මෙම අවනද්ධ පදය වාදනය කළ හැකි භාණ්ඩය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

13. කෝළම් රංග සම්ප්‍රදායට වාදනය කරනුයේ කුමන අවනද්ධ වාද්‍ය භාණ්ඩය ද?

(1) A (2) B (3) C (4) D

14. "දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ධා" මෙම ගීතය ඇතුළත් රංග සම්ප්‍රදායට වඩාත් ගැළපෙන්නේ කුමන වාද්‍ය භාණ්ඩය ද?

(1) A (2) B (3) C (4) D

15. B භාණ්ඩයට අදාළ නිවැරදි කියමන තෝරන්න.

(1) 'දෙමි / කිට / කිට / දෙමි' මෙම පදය වාදනය කිරීමට සුදුසු ය.
(2) සොකරි රංග සම්ප්‍රදාය සඳහා යොදගනු ලැබේ.
(3) පහතරට ශාන්තිකර්ම සඳහා වාදනයට සුදුසු ය.
(4) මෙම භාණ්ඩය වාදනය කරමින් පොතේගුරු චරිතය වේදිකාවට පිවිසේ.

16. A භාණ්ඩය වාදනය සඳහා යොදගත් නිර්මාණ තෝරන්න.

(1) පද්මාවතී, සිරිසඟබෝ, රාමායණය (2) ජසයා, ලෙන්චිනා, සඳකිඳුරු
(3) සැඬසුළං, රේබාව, ගැටවරයෝ (4) බැලසන්ත, බුම්පොට්, ඉයුජින්

17. C භාණ්ඩය සඳහා ගැළපෙන කොටස් නාම තෝරන්න.

(1) බද්ධි, ගට්ටා, සයාහි (2) කැපුම් හම, වෙනිවර කැරැල්ල, කයිපුඩිවළල්ල
(3) බඳම, පුහුල, තට්ටුව (4) බුම් එක, පීල් එක, තෝඩායම

[ තුන්වැනි පිටුව බලන්න.

60472



18. C භාණ්ඩයේ X හා Y වශයෙන් වෙන්කළ කොටස් දෙකකි. එම කොටස් දෙක නම් කරන්නේ කෙසේ ද?
    (1) X කොටස "බුම්" යනුවෙන් ද, Y කොටස "ජිල්" යනුවෙන් ද නම් කෙරේ.
    (2) X කොටස "තබ්ලා" යනුවෙන් ද, Y කොටස "ඨේකා" යනුවෙන් ද නම් කෙරේ.
    (3) X කොටස "දයං" යනුවෙන් ද, Y කොටස "බායං" යනුවෙන්ද නම් කෙරේ.
    (4) X කොටස "හඬබෑය" යනුවෙන් ද, Y කොටස "පුරප්පට්ටුව" යනුවෙන් ද නම් කෙරේ.

19. C යන භාණ්ඩයේ X,Y වශයෙන් වෙන්කළ කොටස් දෙකෙන් නිකුත්වන අවනද්ධාක්ෂාර වෙන් වශයෙන් දක්වන්නේ කෙසේද?
    (1) X කොටසින් "න, ත, තිට යන අක්ෂර ද", Y කොටසින් "ක, ගෙ, කත්, යන අක්ෂර ද" නිකුත් වේ.
    (2) X කොටසින් "ක, ගෙ, කත් යන අක්ෂර ද", Y කොටසින් "න, ත, තිට, යන අක්ෂර ද" නිකුත් වේ.
    (3) X කොටසින් "ධා, ගි, න යන අක්ෂර ද", Y කොටසින් "තුන්, නා, යන අක්ෂර ද" නිකුත් වේ.
    (4) X කොටසින් "ධා, ධි, ගින යන අක්ෂර ද", Y කොටසින් "තිරිකිට යන අක්ෂර ද" නිකුත් වේ.

20. චිත්‍රපට ගී හා සරල ගී ඇතුළත් ගායන වැඩසටහනක් සඳහා වඩාත් උපයෝගී වන්නේ කුමන භාණ්ඩ ද?
    (1) A හා B (2) B හා C (3) C හා D (4) D හා A

21. "උරුට්ටුව" ඇතුළත් ගී විශේෂයට වාදනය සඳහා යොද ගන්නා භාණ්ඩය වන්නේ,
    (1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

- පහත වගුවේ දේශීය ජන සංගීතාංග පිළිබඳ තොරතුරු ඇතුළත් වේ. එම තොරතුරු ආශ්‍රයෙන් අංක **22** සිට **24** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A | පහත රට සින්දු වන්නම් | සේවිත පාද සරෝරුහ සන්ජිතයෙන් ඉතා |
| B | සබරගමු වන්නම් | රත්රසා සේම වඩන වන්යසා රූප දිලෙන |
| C | සබරගමු වන්නම් | කොහොවියනා හඬ නගනා මියුරු වනා දනසවනා |
| D | උඩරට වන්නම් | මෝරා බිජයෙනා |

22. කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත හයවන පරාක්‍රමබාහු රජතුමා සම්බන්ධ වනුයේ
    (1) A තීරුව හා සම්බන්ධ තොරතුරුවලට ය. (2) B තීරුව හා සම්බන්ධ තොරතුරුවලට ය.
    (3) C තීරුව හා සම්බන්ධ තොරතුරුවලට ය. (4) D තීරුව හා සම්බන්ධ තොරතුරුවලට ය.

23. තාල රූප දෙකකින් යුක්ත වන්නම සම්බන්ධ වන්නේ,
    (1) A තීරුව හා සම්බන්ධ තොරතුරුවලට ය. (2) B තීරුව හා සම්බන්ධ තොරතුරුවලට ය.
    (3) C තීරුව හා සම්බන්ධ තොරතුරුවලට ය. (4) D තීරුව හා සම්බන්ධ තොරතුරුවලට ය

24. තිසරා වන්නම හා සම්බන්ධ තොරතුරු ඇතුළත් වනුයේ,
    (1) A තීරුවට ය. (2) B තීරුවට ය. (3) C තීරුවට ය. (4) D තීරුවට ය.

- රාගධාරී සංගීතයට අයත් තොරතුරු ඇතුළත් වගුවක් පහත දක්වේ. එම වගුවේ තොරතුරු ආශ්‍රයකර ගනිමින් අංක **25** සිට **29** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| A | ශුද්ධ ස්වර හත ම යෙදේ. |
| B | ස්වර පහක් යෙදේ. එම ස්වර සියල්ල ශුද්ධ ය. |
| C | ධ. ග. ස්වර වාදී සංවාදී වේ. |
| D | ගරිස, ධසරි, ගප, ධප ග යනු විශේෂ ස්වර සංගතියකි. |
| E | පංචමය (ප), සඩ්ජය (ස) වාදී සංවාදි වේ. |
| F | රි නි ධ නි ප ධ මප මග මප ම ...... යනුවෙන් ශුද්ධ ගාන්ධාරය විවාදී ස්වරයක් ලෙස යෙදේ. |
| G | සර්ව කෝමල රාගය වශයෙන් හැඳින් වේ. |
| H | විවාදී ස්වර පහක් ද ඇතුළත් ව ස්වර දොළහම යෙදේ. |
| I | යන එන ස්වර ගෙන නිරිගම්/පධනිස- නිධපම්/ගරිස- |
| J | ගා ස්වර වාදී නි සංවාදී |

25. බිලාවල් රාගයට අදාළ විශේෂතා වන්නේ,
    (1) A හා B ය. (2) A හා C ය. (3) C හා D ය. (4) D හා E ය.

26. භූපාලි රාගයට අදාළ විශේෂතා වන්නේ,
    (1) I හා J ය. (2) B හා D ය. (3) C හා E ය. (4) D හා F ය.


27. කාෆි රාගයට අදාළ විශේෂතා වන්නේ,
    (1) A හා B ය. (2) C හා D ය. (3) E හා F ය. (4) G හා H ය.

28. භෛරවී රාගයට අදාළ විශේෂතා වන්නේ,
    (1) A හා B ය. (2) C හා D ය. (3) E හා F ය. (4) G හා H ය.

[ හතරවැනි පිටුව බලන්න.

29. යමන් රාගයට අදාළ විශේෂතා වන්නේ,
(1) C හා D ය. (2) I හා J ය. (3) E හා F ය. (4) G හා H ය.

- "කෝඩ්ස්" යනුවෙන් ව්‍යවහාරික සංගීතයේ දී භාවිතකරනු ලබන්නේ ස්වර තුනක් හෝ කිහිපයක් එකවර වාදනය කරන අවස්ථාවකි. පහත ප්‍රස්තාරයේ එසේ ස්වර තුනක් එකවර වාදනය කරන බව පැහැදිලි වන අතර කෝඩ්ස් හතරක් ලියා දක්වේ. අංක **30** සිට **35** තෙක් ප්‍රශ්නවලට එම ප්‍රස්තාර කොටස ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.




30. ඉහත රූපසටහනේ A,B,C,D යන අක්ෂරවලින් දැක්වෙන කෝඩ්ස් (Chords) වන්නේ (පිළිවෙළින්)
(1) C major, F major, G major, C major (2) F major, G major, C major, C major
(3) G major, C major, C major, F major (4) C major, C major, F major, G major

31. ඉහත කෝඩ්ස්වලට වඩාත් ගැළපෙන ස්වර පාදය වන්නේ,
(1) ස ග ප - / ම ධ ස̇ ධ / ප ප නි රි̇ / ස̇ - - - / (2) ම̣ ධ̣ ස ධ̣ / ස ග ප - / ප ප නි රි̇ / ස̇ - - - /
(3) ස ග ප - / ප̣ ප̣ නි̣ රි / ම ධ ස̇ ධ / ස̇ - - - / (4) ස̇ - - - / ග - - - / ප ප නි රි̇ / ස̇ ග̇ ප̇ - /

32. ඉහත කෝඩ්ස් හතර යොදගැනීම වඩාත් ගැළපෙන්නේ කුමන ස්කේලයකට අයත් ගීතයකට ද?
(1) C major scale (2) C minor scale
(3) F major scale (4) G major scale

33. ඉහත කෝඩ්ස් හතර යොදාගැනීමට වඩාත් ගැළපෙන ස්කේලයට අයත් ආරෝහණ ස්වර මොනවා ද?


(1) F, G, A, B♭, C, D, E, F.

(2) C , D, E, F , G , A , B.


(3) C , D, E♭, F , G , A♭ , B♭.


(4) G , A , B, C, D , E, F♯, G.

34. "ප ග ප / ධ - - / නි ප නි / ස - - /" යන ස්වර පාදයට ඉහත කෝඩ්ස් හතර වාදනය සඳහා ලියා ඇති නිවැරදි ප්‍රස්තාර කොටස කුමක් ද?

1. 

2. 

3. 

4. 

[ පස්වැනි පිටුව බලන්න.

35. ඉහත ප්‍රස්තාර කොටස් අතුරෙන් "බෙම්ටෝ" තාලයට ගැළපෙන ප්‍රස්තාර කොටසක් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) පළමුවන පිළිතුර (2) දෙවන පිළිතුර
(3) තෙවන පිළිතුර (4) සිව්වන පිළිතුර

36. රාගධාරි සංගීතය ඇසුරින් නිර්මාණය කළ සරල ගී බොහොමයක් ශ්‍රී ලාංකේය සමාජය තුළ ජනප්‍රියව පවතී. පහත දැක්වෙන පිළිතුරුවල නිවැරදි පිළිතුරු මොනවා ද?
(a) "සාධු දන්තදා - වදිමි සාර ශාන්ති ශ්‍රී පතාලා" - මෙම ගීතය යමන් රාගය ආශ්‍රිත ය.
(b) "කවාලා විළඳ ජාති ඇති කළත් රත් කුඩුවේ ගිරවා" - මෙම ගීතය භෛරවී රාගය ආශ්‍රිත ය.
(c) "එන්න මදනලේ ගොස් පවසන්න දුක මගේ" - මෙම ගීතය භූපාලි රාගය ආශ්‍රිත ය.
(d) "අඳුර අඳුර මගේ" - මෙම ගීතය භිම්පලාසි රාගය ආශ්‍රිත ය.
(1) a සහ b (2) b සහ c (3) c සහ d (4) d සහ e

37. නාට්‍ය නිර්මාණ බොහොමයක ඇතුළත් ගීත ද, ශ්‍රී ලාංකේය සමාජය තුළ ජනප්‍රියව පවතී. පහත දැක්වෙන්නේ එවැනි ජනප්‍රිය ගීත කිහිපයක මුල් කොටස් ය.
(a) "තැන් තැන්වලම ලැගී සන්නත් මුවන් රැළ"
(b) "ප්‍රේමයෙන් මන රංජිතවේ නන්දිත වේ"
(c) "අන්න බලන් සඳ රන්තැටියෙන්"
(d) "යස ඉසුරු පිරුණු තැනා"
ඉහත ගීත අතුරෙන් මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර ගුරින් අතින් නිර්මාණය වූ ගීත වන්නේ
(1) a සහ b (2) b සහ c (3) c සහ d (4) d සහ e

38. "ගසල්" ගායන ශෛලියට නොගැළපෙන පිළිතුර කුමක් ද?
(1) ආරම්භයේදී තාලයෙන් තොර දෙහොරාව යනුවෙන් හඳුන්වන කොටසක් ගායනය කිරීම.
(2) ආදරය සහ ශෘංගාර රසය පදමාලාවල ගැබ්ව තිබේ.
(3) ගුලාම් අලි, පන්කජ් උදස්, ජග්ජිත්සිං වැනි ඉන්දියානු ගායකයින් මෙම ගීත ගායනයේ ජනප්‍රිය වීම.
(4) ස්ථායි, අන්තරා අවසානයේ ආකාර තාන ස්වරාක්ෂර තාන යොදා ගැනීම.

39. "මෝසාර්ට්" නම් බටහිර සංගීතඥයාගේ විශිෂ්ට සිම්පනි තුනට අයත් නොවන්නේ කුමක් ද?
(1) ජුපිටර් සිම්පනිය (2) Number 39 Symphony
(3) Number 40 Symphony (4) කෝරල් සිම්පනිය

40. "සංධ්වනියක" දී වයලින්, වියෝලා, චෙලෝ යන සංගීත භාණ්ඩ අයත් වන්නේ
(1) Wood Wind වර්ගයට ය. (2) Brass Wind වර්ගයට ය.
(3) String වර්ගයට ය. (4) Percussion වර්ගයට ය.

⁂

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**40 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2009 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2009 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2009

## සංගීතය - (සිංහල) II

※ පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

**1.** කෙටි පිළිතුරු සපයන්න. වරහන් තුළ දක්වෙන සංගීත භාණ්ඩ වට්ටෝරුව සම්බන්ධ කරගනිමින් **(i)** සිට **(iv)** තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. එක භාණ්ඩයක් භාවිත කළ හැකිවන්නේ එක්වරකි.

**(එස්රාජ්, තබ්ලාව, සිතාර්, බටනලාව, සර්පිනාව, මද්දලය, යක්බෙරය, හොරණෑව)**

(i) ස්වර පිහිටන ස්ථාන සමානවන භාණ්ඩ යුගලය කුමක් ද?
(ii) තූර්ති සංගීත සඳහා යොදගත් සංගීත භාණ්ඩ යුගලය දක්වන්න.
(iii) අවනද්ධ වර්ගයට අයත් භාණ්ඩ **දෙකක්** නම් කරන්න.
(iv) සුසිර වර්ගයට අයත් භාණ්ඩ **දෙකක්** නම් කරන්න.

- **(v)** සිට **(viii)** තෙක් ප්‍රශ්නවල දක්වෙන ප්‍රකාශ වැරදි ය. එම ප්‍රකාශ නිවැරදිකර ලියන්න.

(v) සත්සමුදුර චිත්‍රපටියේ සංගීතය නිර්මාණය කළේ ආචාර්ය ඩබ්.ඩී. අමරදේව ගුරුන් ය.
(vi) 'රජිත මමයි අපේ රාජ්ජේ' ගීතය මාතලන් චිත්‍රපටියට අයත් ය.
(vii) 'රූ රැසේ අදිනා ලෙසේ' පද්‍යය සමුද්‍රඝෝෂ වෘත්තට අයත් පැදියකි.
(viii) 'ආලෙ බැන්ද මාගෙ රම්‍යවන්' යන ගීතය සිංහබාහු චරිතය විසින් ගයනු ලබන්නකි.

- **(ix)** සිට **(x)** තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවා ලියන්න.

(ix) ශුද්ධ ග, නි විවාදී ස්වර වන්නේ ...................... රාගයේ වන අතර ශුද්ධ රි, ග, ධ, නි සහ තීව්‍ර ම විවාදී වන්නේ ...................... රාගයේ දී ය.

(x) ...................... රාගය ඖඩව ජාති වන අතර ...................... රාගය සම්පූර්ණ ජාති රාගයකි.

**2.** (i) "ස් ස් ධ ප / ග රි ස - / ස ධ̣ ස රි / ග රි ග - /
..............\/..............\/..............\/.............."

(a) ඉහත ප්‍රස්තාර කොටස අයත් රාගයේ නම කුමක් ද?
(b) එම ප්‍රස්තාරයේ දෙවන පාදයට සුදුසු ස්වර රාගානුකූලව ලියා දක්වන්න.
(c) 'සරිස-, සරිගරිස-, ..........,..........,..........' මෙම ස්වර අභ්‍යාසය ඉහත රාගයට අදළ ව සම්පූර්ණ කර ගොඩනගන්න.

(ii) "නි̣ රි ග රි / ස - නි̣රි ගම් / ප රි ග රි / ස - - - /"

(a) ඉහත ස්වර ප්‍රස්තාර කොටස කුමන රාගයට අයත් ද?
(b) මෙම රාගයට අයත් ස්ථායි කොටසක් ස්වර ප්‍රස්තාර කර දක්වන්න.
(c) එම රාගයේ විශේෂතා **හතරක්** දක්වන්න.

**3.** (i) පහත දක්වෙන ගී පාද ගායනය කිරීමට සුදුසු තාල අනුව පද ප්‍රස්තාර කර දක්වන්න.

(a) පිනි වැටුන සීතලේ - සඳ නැගුනු රාත්‍රියේ
(b) සුවඳ හමනා මලක් විලසින් - ජීවිතේ මගෙ හැඩවෙනා

(ii) ඉහත ගී පාද දෙකට සුදුසු තාල නම්කර සංකේත යොදමින් ප්‍රස්තාර කරන්න.
(iii) එම තාල පදවලට අයත් අවනද්ධාක්ෂර තබ්ලාවෙන් නිකුත්වන ස්ථාන රූපසටහනක් මගින් පැහැදිලි කරන්න.

[ හත්වැනි පිටුව බලන්න.

4. (i) පහත දක්වෙන ජනගී පාද පැල් ගී, පතල් ගී, ගොයම් ගී, ගැල් ගී, බඹර ගී, කමත් ගී, කළගෙඩි කවි, ලී කෙළි යන ගී වර්ගවලට වෙන්කර ලියන්න.

- තන්ඩලේ දෙන්න දෙසොලේ දක්කනවා
- අහසට පිඹිනා - එරන් කළේයා
- ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
- දුම්බර කන්ද පාමුල මිනිරන් පතලේ
- එක පඳුරෙන් ලී සයක් කපා ගෙන
- රන්දකැති ගෙන නිති සැරසෙනවා
- ඉහළ වෙලේ තියෙන බැනා
- අම්මපල්ල බඹරුන් අත වරද නැති

(ii) ඉහත ගී පාද ආඝාතාත්මක සහ අනාඝාතාත්මක වශයෙන් වෙන්කර දක්වන්න.

(iii) ගැමියන් අතින් ඉහත ගැමි ගී නිර්මාණය වීමට පදනම් වූ හේතු සාධක දක්වා ගැමි ගී බොහොමයක් අනාඝාතාත්මක වීමට හේතු දක්වන්න.

5. පහත දක්වෙන වගුවේ ශ්‍රී ලංකාවේ ව්‍යවහාරික සංගීතයේ ගීත හා නිර්මාණකරුවන් දක්වේ. ඒවා ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.


| *A* ජනප්‍රිය ගීත | *B* නිර්මාණකරුවන් |
|---|---|
| අක්කෙ අක්කෙ අර බලන්නකෝ වැස්සක් නොවැ එන්නේ | ආර්. මුත්තුසාමි |
| වරෙන් හිත්සැරේ රිදී වලාවේ | ඩබ්.ඩී. අමරදේව |
| ශාන්තමේ රාත්‍රියේ | සෝමදාස ඇල්විටිගල |
| දුර ජේත තැනිතලා - අනුරාධපුර දිහා | බී.ඇස්. පෙරේරා |
| සීත ර. යාමේ අඳුරේ | මොහොමඩ් ගවුස් |
| සිනිඳු සුදුමුතු තලාවේ | ආනන්ද සමරකෝන් |
| ඇත ගව් ගනන් දුරින් | සුනිල් සාන්ත |
| රන්වන්රන් කරලින් පැසිලා නැමිලා බරවිලා | ආචාර්ය ප්‍රේමසිරි ඛේමදාස |

(i) "*A*" තීරුවේ ඇති ගීතවලට අදාළ නිර්මාණකරුවන් "*B*" තීරුවෙන් තෝරා ලියන්න.

(ii) "*A*" තීරුවේ ඇති ගීතවලින් ගීත **හතරක්** තෝරා ඒවා අයත් චිත්‍රපට නම් කරන්න.

(iii) සුනිල් සාන්ත හෝ ආනන්ද සමරකෝන් යන සංගීතඥයින් අතින් නිර්මිත ගීතයක මුල් කොටස ගීත ස්වර ප්‍රස්තාර කර එම දෙපළ මුල් යුගයේ සරල ගී නිර්මාණයට ලබාදුන් දායකත්වය කෙටියෙන් පැහැදිලි කරන්න.

6. (i) පහත දක්වෙන රූපසටහන් ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායයන් තුනකට අයත්ය. ඒවා ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



*A* *B* *C*

(a) *A*, *B* සහ *C* යන රූපසටහන්, සම්බන්ධවනුයේ කුමන රංග සම්ප්‍රදායන් ට ද?

(b) *A* රංග සම්ප්‍රදායට අයත් නාට්‍ය දෙකක නම් ලියන්න.

(c) *C* රංග සම්ප්‍රදායට අයත් චරිත දෙකක් නම් කරන්න.

(d) *A* සහ *C* යන රංග සම්ප්‍රදායන් අතර වෙනස්කම් **හතරක්** දක්වමින් සැසඳීමක් කරන්න.

(ii) "*B*" රංග සම්ප්‍රදායට අයත් ගීතයක මුල් පාදය ස්වර ප්‍රස්තාර කර එම ගීයේ සංගීතමය ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

7. පහත දක්වෙන මාතෘකා අතුරෙන් **දෙකක්** තෝරා ගෙන බිත්ති පුවත් පතකට ලිපි සකස් කරන්න.

(i) බටහිර සම්භාව්‍ය සංගීතයේ සුවිශේෂී නිර්මාණකරුවන්

(ii) පරිගණකය සංගීත අධ්‍යාපනයේ ප්‍රබල මෙවලමක් ලෙස

(iii) කපිරිඤ්ඤ සංගීතයේ විශේෂ ලක්ෂණ

* * *